# 11 සොරබොර වැව

ඉස්සර කාලෙ අපේ රජවරුන්ට යෝධයෝ හිටියා. එයාලා මහ පුදුම හිතෙන දේවල් කළ හැකි අය. එයාලා තමයි විශාල වැව්, දාගැබ් හදන්න රජවරුන්ට උදව් කරලා තියෙන්නේ. වේළුසුමන, ගෝඨයිම්බර, ථේරපුත්තාභය වැනි යෝධයින් ගැන සමහර විට ඔබ අසා ඇති. අද අපි කතා කරන්නේ බුලතා කියලා යෝධයෙකු ගැන.

බුලතා ජීවත් වුණේ දුටුගැමුණු රජතුමාගෙ කාලෙ. රජතුමාට බුලත් සැපයීම බුලතාගේ රාජකාරිය වුණා. දවසට හත් අට වතාවක් මේක කරන්න ඕනෑ. වෙලාවට හොඳින් රාජකාරි කිරීම බුලතාගේ සිරිතක්. රාජකාරියෙන් පස්සේ වැඩක් නැති වෙලාවට අවට පරිසරය නැරඹීමට ඔහු පුරුදු ව සිටියා.

බුලතා යෝධයා රාජකාරියට යන පාරේ විශාල කඳු දෙකක් තිබුණා. ඒ අතර තැනිතලාවක් තිබුණා. ඒ අතරින් දිය පාරකුත් ගලා බැස්සා. බුලතා යෝධයා මේක දැක්කා. මේ කඳු දෙක හරස් කරලා වැවක් හදන්න පුළුවන් කියලා මොහුට හිතුණා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



මේක අපූරු සිතිවිල්ලක්. බුලතා යෝධයා වැව හැදීමේ වැඩ ආරම්භ කළා. මේ යෝධයා හරි ම ශක්තිමත්. කොච්චර ශක්තිමත් ද කියනවා නම් මොහුගේ උදැල්ල එක මිනිහෙකුට ඔසවන්න බැරිතරම් බරයි. කූඩෙත් එහෙමයි. මිනිස්සු විසිදෙනෙකුට ඔසවන්න බැරි පස් කූඩ ඔහු එකවර ගෙනියනවා. මෙහෙම පස් ගෙනිහින් දාලා පාගා තද කර කඳු දෙක අතර වේල්ලක් බැන්දා. වැවේ වැඩ හුඟක් තිබුණා. ඒ වුණාට බුලතා යෝධයා තම රාජකාරි කවදාවත් අතපසු කළේ නැහැ. එයා පිළිවෙළට වැඩ කරන කෙනෙක්.

බුලතා යෝධයා වේල්ල බැඳලා අවසන් කළා. ඊට පස්සේ අඬුවත් මිටියත් අරගෙන වැවේ සොරොව්ව ගලින් ම නිර්මාණය කළා. වතුර පිටකරන දිය පැන්නුමකුත් නිර්මාණය කළා. අන්තිමේ දී කඳු දෙක අතර ලස්සන වැවක් නිර්මාණය වුණා.

බුලතා යෝධයා තමන්ගේ වැව බලන්න එන්න කියල දුටුගැමුණු රජතුමාට ආරාධනා කළා. රජතුමා පැමිණියා. බුලතා යෝධයා හදපු මේ අපූරු නිර්මාණය දකලා රජතුමා හරියට සතුටු වුණා. "මේක නම් 'හර බර' වැඩක්" රජතුමා කිව්වා. එතැන් පටන් බුලතා හදපු මේ වැවට "හරබර වැව" කියල කියන්න පටන් ගත්තා. හරබර වැව පස්සෙ "සොරබොර වැව" කියල ප්‍රසිද්ධ වුණා.

## ක්‍රියාකාරකම 1

- පාඩම ශබ්ද නගා කියවන්න.
- පාඩම නිශ්ශබ්ද ව කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු කියන්න.

(i) බුලතා යෝධයා ජීවත් වූයේ කුමන රජතුමාගේ කාලයේ ද?

(ii) ඉස්සර කාලෙ හිටපු යෝධයින් තුන් දෙනෙකුගේ නම් කියන්න.

(iii) සොරොව්ව යනු කුමක් ද?

(iv) බුලතා යෝධයාගෙන් ගත හැකි ආදර්ශ දෙකක් කියන්න.

(v) සොරබොර වැවට ඒ නම ලැබුණේ කෙසේ ද?



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 2

- ජාතික උරුමයන් පිළිබඳ සඳහන් පුවත්පත් ලිපි එක් රැස් කර පන්තිය ඉදිරියේ කියවන්න.
- එම ලිපිවල සඳහන් කරුණු පිළිබඳ පන්තියේ සාකච්ඡා කරන්න.

## ක්‍රියාකාරකම 3

පහත සඳහන් වාක්‍යය කියවන්න.

ඔසවන්න <u>බැරි</u> පස් කුඩ ඔහු එකවර ගෙනියනවා.

මෙලෙස බැරි, හැකි, නැති යන පද සහිත වාක්‍ය පාඩමෙන් සොයා හඬ නගා කියවන්න. ඒවා ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

## ක්‍රියාකාරකම 4

පහත සඳහන් වාක්‍ය හඬ නගා කියවන්න.

(i) වීරවරයෝ අනිත් අයට දරන්න බැරි කරදර ඉවසනවා.

(ii) හොඳට ඉගෙන ගන්නේ නැති අය පස්සෙ පසුතැවිලි වෙනවා.

(iii) වැඩ කළ හැකි අයට කොතැනත් ඉඩ තියෙනවා.

(iv) ඉගෙන ගන්න බැරි කෙනෙක් කොහේවත් නෑ.

(v) පිහිටක් නැති අයට පිහිට වෙන එක මහත්මා ගුණයක්.

## ක්‍රියාකාරකම 5

පහත සඳහන් වාක්‍ය දෙක කියවා පද රටා හඳුනා ගන්න.

(අ) එයා පිළිවෙළට වැඩ කරනවා.

(ආ) එයා පිළිවෙළට වැඩ කරන කෙනෙක්.

මේ අනුව පහත දී ඇති වාක්‍ය (ආ) වාක්‍ය රටාවට සකස් කර කියන්න.

(i) මම හොඳට ඉගෙන ගන්නවා.

(ii) අපේ තාත්තා ආණ්ඩුවේ රස්සාවක් කරනවා.

(iii) අපේ අම්මා අපට ආදරය කරනවා.

(iv) හිමාලි ලස්සනට ගීත ගායනා කරනවා.

(v) අපේ ගුරුතුමී අපට හොඳට උගන්වනවා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 6

පහත සඳහන් වාක්‍ය යුගල කියවා ඒවා අතර ඇති සම්බන්ධය හඳුනා ගන්න.

(i) අ. බුලතා යෝධයා සොරබොර වැව හැදුවා.

ආ. බුලතා යෝධයා හදපු වැවයි, සොරබොර වැව.

(ii) අ. අපේ අම්මා බලුපැටියෙකු හැදුවා.

ආ. අපේ අම්මා හදපු බලුපැටියා තමයි බූලා.

(iii) අ. හිමාලි ලස්සනට ගීත ගැයුවා.

ආ. හිමාලි ලස්සනට ගයපු ගීතය තමයි, මුල්තැන දිනුවේ.

(iv) අ. අපේ තාත්තා ආණ්ඩුවේ රස්සාවක් කෙරුවා.

ආ. ආණ්ඩුවේ රස්සාවක් කරපු අපේ තාත්තා, දැන් විවේකයෙන් ඉන්නවා.

## ක්‍රියාකාරකම 7

(i) පහත සඳහන් වචන ඇතුළත් වාක්‍ය පාඩමේ සඳහන් වේ. එම වාක්‍ය සොයා නැවත කියවන්න.

එහෙම

මෙහෙම

කොච්චර



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(ii) පහත දී ඇති වචන යොදා වාක්‍යවල හිස්තැන් පුරවන්න.

(i) ______________ලෙඩේ සනීප වුණා ද මම දන්නෙ නෑ.

(ii) ______________ වුණත් පරිස්සමින් යන්න.

(iii) තරු තියෙන අහස රෑට ______________ලස්සනයි ද?

(iv) ______________හරි හොඳට ඉගෙනගන්න ඕන.

(v) මේ වැඩය ______________හරි කරන්න.

(vi) ______________ගියත් උගතා පිළිගන්නවා.

(vii) මේකෙ ගණන ______________ද?

(කොච්චර, කොහොම, කොයිකෙන්, මෙහෙම, කොයිකට, කොහේ)

## ක්‍රියාකාරකම 8

පහත සඳහන් වචන යොදා වාක්‍ය හදන්න.

| | | |
|---|---|---|
| එහෙම | එච්චර | කොයිකට |
| මෙහෙම | මෙච්චර | කොයිකෙන් |
| අරහෙම | අච්චර | |
| කොහොම | කොච්චර | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 9

පහත සඳහන් ගීය ගායනය කරමින් ක්‍රීඩාවක නිරත වන්න. (ගුරුතුමාගේ / ගුරුතුමියගේ උපදෙස් ලබා ගන්න.)

අතුරු මිතුරු දඹදිවතුරු
රාජකපුරු හෙට්ටියා

වරා ගහට ගිහින් බොලන්
පුහු කලටිය නෙළන් බොලන්

අලුත ගෙනා මනමාලී
සාල්පතක් ගරාපී

පරණ ගෙනා මනමාලී
බටු කොරහක් කපාපී

ඉහළ ගෙටත් බෙදාලා
පහළ ගෙටත් බෙදාලා

ළිඳේ තිබුණු කිරි මුට්ටී
හතෙන් එකක්
ගොඩට ගනින් යාළුවේ.





නොමිලේ බෙදා හැරීම සඳහා ය.